**සීමා නිර්ණය කොමිෂන් සභාව**
**2018 වර්ෂයේ ප්‍රථම ත්‍රෛමාසික සාධන වාර්තාව**
**2018 ජනවාරි 01 - 2018 මාර්තු 31**

## 1.0 පසුබිම

වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව 2015.11.13 දින ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ 41B හා 95(1) ව්‍යවස්ථාවන්ට අනුකූලවය. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා ආචාර්ය කේ.තවලිංගම්, සාමාජිකයන් වන ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක හා මහාචාර්ය එස්.එච්. හස්බුල්ලා යන තිදෙනාගෙන් සමන්විතය.
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 හා 96 ව්‍යවස්ථා වලින් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් කියැවේ. කෙසේ වුවද අනිකුත් කොමිෂන් සභා සම්බන්ධයෙන් මෙන් නොව මෙම සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් නොවේ.

- කොමිෂන් සභාවේ කාර්යයන්
- කොමිෂන් සභාවේ බලතල

ආරම්භයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉඟිකරන ලද අදහස වූයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන අවස්ථාවේදී තනි සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීමට හා එහි වගකීම් භාරය විස්තර කරන විට සියලුම භූගෝලීය සීමා මායිම් නිර්ණය කිරීම න්‍යායානුගත කිරීමට කටයුතු කරන බවය.

## 2.0 **දැක්ම**:- සාදාචාරාත්මක හා සාධාරණ මූලධර්ම මත සීමා නිර්ණය කිරීමෙහි විශිෂ්ඨත්වය කරා ළඟා වීම

**මෙහෙවර**-:ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ලැබී ඇති පරිදි ස්වාධීන ලෙස හා සදාචාරාත්මක ලෙස, කාර්යක්ෂමවද, පාරදෘශ්‍යතාවයෙන් යුක්තවද, විශ්වසනීය ලෙස හා නීතියට අනුකූලව සීමා නිර්ණය කිරීම.

**අරමුණු**

- සෑම ඡන්ද දායකයෙකුටම හෝ පුරවැසියෙකුටම ඉහළම ප්‍රමාණයෙන් සමාන නියෝජනයක් ලැබෙන පරිදි හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රිය අයිතිවාසිකම් හා එම වාතාවරණය සුරක්ෂිත වන ලෙස හා කාර්යක්ෂම ලෙස තහවුරු කිරීම සඳහා මැතිවරණ කොට්ඨාස හා වෙනත් පරිපාලන ඒකක සීමාවන් නිර්ණය කිරීම.
- මැතිවරණ කොට්ඨාස හෝ පරිපාලන ප්‍රදේශ හෝ අධ්‍යාපන , සෞඛ්‍ය හෝ ආරක්ෂක වැනි සමාජ - ආර්ථික සේවාවන් සඳහා නිර්ණය කිරීමට භාරදෙන, සීමා නිර්ණයන් නියමිත කාල රාමුව තුල නිම කිරීම.
- රජයට හා වෙනත් ආයතන වලට ස්වකීය තීරණ ගැනීම සඳහා අවශ්‍ය සීමා නිර්ණයන්හිදී අවශ්‍ය දැනුම හා තොරතුරු ලබා දීම.
- සීමා නිර්ණය පිළිබඳ තොරතුරු හා අදාළ ලියකියවිලි එක් රැස්කරන මධ්‍යස්ථානයක් පිහිටුවීම.

## 3.0 ප්‍රතිපත්තිමය කරුණු

### 3.1 ක්‍රියාකාරි සැලැස්ම

වර්ෂය තුළදී අපේක්ෂිත ව්‍යවස්ථා සංශෝධන සිදු නොවීය. එබැවින් 2018 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින ලදුව 2018 ක්‍රියාකාරී සැලැස්මට පහත සඳහන් කරුණු ඇතුළත් කිරීමට තීරණය කරන ලදි.

1) අදාළ තොරතුරු එක් රැස් කිරීම (පරිපාලන ඒකක හා පළාත් පාලන ආයතන පිහිටුවීමට අදාළ සියලුම ගැසට් නිවේදන එකතු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.)

2) ශ්‍රී ලංකාවේ ජනගහනය හා ඉඩම් ප්‍රමුඛතාවන් විමර්ශනයෙහිලා උපයෝගීකරගත හැකි විස්තෘත විශ්ලේෂණයන් අඩංගුවන පූර්වගාමී සීමා නිර්ණ වාර්තා

3) පළාත් පාලන ආයතන සඳහා සීමා නිර්ණය කිරීම සම්බන්ධයෙන් මෑතකදී ලැබුණු තොරතුරු අධ්‍යයනය කිරීම

### 3.2 පළාත් සභා සම්බන්ධයෙන් වන මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීම

2017 පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත 2017.09.20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදි. “පංච පුද්ගල සීමා නිර්ණය කමිටුවක් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.” පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා මායිම් වෙනස් කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා අනිකුත් සාමාජිකයන් දෙදෙනාද, අතිරේක තවත් සාමාජිකයන් දෙදෙනෙකුද ඇතුළත් වන සීමා නිර්ණය කමිටුව පත් කිරීමට කථානායකවරයා ජනාධිපතිවරයාට යෝජනා කළේය.

පළාත් සභා වලට පරිපාලන දිස්ත්‍රික්කවලින් සභිකයන් 50% ක් සරල බහුතර ක්‍රමයට පත් කිරීමට හැකිවන සේ මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීම සඳහා ජනාධිපතිවරයා 2017.10.04 දින පළාත් සභා සීමා නිර්ණය පංච පුද්ගල කමිටුව (පළාත් සභා සීමා නිර්ණය කමිටුව) පත් කළේය.19 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව මෙම කමිටුවට සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් දෙදෙනාද ඇතුලත් වූහ. මෙම පත්වීම් වලට අදාළ නිවේදනය 2017.10.04 දිනැති අංක 2039/29 දරණ ගැසට් පත්‍රයේ පළ විය. එම කමිටුව 2017 ඔක්තෝබර් මස සිය කටයුතු ආරම්භකොට 2018 පෙබරවාරි මස නිම කළාය.

## 4.0 ගත වූ මාස තුන තුළ සාධනය

### 4.1 රැස්වීම්

**සීමා නිර්ණය කොමිෂන් සභාවේ රැස්වීම්:-** සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් 2018.02.04 දින දක්වා පළාත් සභා සීමා නිර්ණය කමිටුවේ සාමාජිකයන් වශයෙන් ඉටු කළ යුතු වූ කාර්ය භාරය නිමකිරීමෙහි නියැලුනු නිසා 2018 ජනවාරි 11 දින සිට මාර්තු 31 දක්වා කාලය තුළ පරිපාලන හා ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්විය හැකි වූයේ එක් වතාවක් පමණි.

2018.03.14 – 26 වැනි රැස්වීම

**පළාත් සභා සීමා නිර්ණය කමිටු රැස්වීම්:-** 2018 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා පළාත් සභා මැතිවරණ කොට්ඨාස නිර්ණය කිරීමේ වාර්තාව නිම කිරීම සඳහා රැස්වීම් 04 ක් පවත්වන ලදි.

2018.01.03 – 15 වැනි රැස්වීම<br>
2018.01.10 – 16 වැනි රැස්වීම<br>
2018.02.05 – 17 වැනි රැස්වීම<br>
2018.02.08 – 18 වැනි රැස්වීම

### 4.2 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා පනතක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය යෝජනාවක් සකස් කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය යෝජනාවක් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදි. ඊට ප්‍රතිචාර වශයෙන් අමාත්‍ය මණ්ඩලයට සාකච්ඡාවට භාජනය කළ හැකි වෙන පරිදි අවශ්‍ය තොරතුරු හා යෝජනා ඇතුළත් ප්‍රතිපත්තිමය යෝජනාවක් සකස්කොට අමාත්‍ය මණ්ඩල සංදේශයක් (ප්‍රතිපත්තිමය යෝජනාවට ඇමුණුමක් ලෙස.) සකස් කරන ලෙස උපදෙස් ලැබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත 2017.10.18 දින ජනාධිපති ලේකම්වරයා වෙත යවන ලදි. මෙතෙක් ඊට පිළිතුරු ලැබී නැත.

## 5.0 පරිපාලනමය කරුණු

### 5.1 සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යාල පහසුකම්

2016 වර්ෂයේ සිට සීමා නිර්ණය කොමිෂන් සභා කාර්යාලය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කුලී ගෙවීමකින් තොරව පවත්වාගෙන යාමට මැනුම්පතිවරයා ඉඩ සලසා දුන්නේය. වර්ග අඩි 790 ක ඉඩ ප්‍රමාණයක් මේ සඳහා ලැබුණු අතර එය කාමර තුනකට බෙදන ලදි. ඉඩ අවකාශයට අමතරව, විදුලිය, ජලය, වැසිකිලි පහසුකම්, රථගාල වැනි සියලුම පහසුකම් මැනුම්පතිවරයා විසින් සලස්වා දෙන ලදි.

**වර්තමාන කාර්යාලයීය ලිපිනය**

සීමා නිර්ණය කොමිෂන් සභාව
සර්වේයර් ජනරාල් කාර්යාල ගෙඩනැගිල්ල
තැ.පෙ.506
කොළඹ 05

### 5.2 ප්‍රවාහන කටයුතු

මහා භාණ්ඩාගාරය විසින් සීමා නිර්ණය කොමිෂන් සභාවට 2016 වසරේදී වාහන 2ක් ලබා දෙන ලදි. CAP 7180 දරණ වාහනය ජනාධිපති ලේකම් නමින් ලියාපදිංචි කර එනමින් රක්ෂණය කර ඇති අතර එය සභාපතිවරයා සඳහා වෙන් කර ඇත. දෙවැනි මෝටර් රථය CAR 0347 ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුයුක්ත කරන ලදි.

### 5.3 සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම

සීමා නිර්ණය කොමිෂන් සභාවට පැවරෙන කාර්යභාරයේ භාරදූරත්වය සලකා කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ 2016.02.05 දිනැති අංක DMS/1029 ලිපියෙන් පහත සඳහන් පත්වීම් අනුමත කර ඇත.

| තනතුර | මට්ටම | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේතය |
|---|---|---|---|
| ලේකම් | ජ්‍යෙෂ්ඨ | 01 | SL-3-2006 |
| ගණකාධිකාරි | ජ්‍යෙෂ්ඨ | 01 | SL-1-2006 |
| සම්බන්ධීකරණ ලේකම් | තෘතියික | 01 | රා.පරි.ච. 6/2006 |
| පරිපාලන නිලධාරි | තෘතියික | 01 | MN-7-2006 |
| භාෂා පරිවර්තක | ද්විතියික | 03 | MN-6-2006 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ද්විතියික | 02 | MT-1-2006 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ද්විතියික | 02 | MN-2-2006 |
| රියදුරු | ප්‍රාථමික | 02 | PL-3-2006 |
| කාර්යාල සහයක | ප්‍රාථමික | 02 | PL-1-2006 |
| එකතුව | | 15 | |

මෙම කාර්තුව තුළ පහත සඳහන් පත්වීම් සිදුකර ඇත.

- වැඩ බලන ලේකම් - සමන් ශ්‍රී රත්නායක මහතා -: 2018 මාර්තු 21 දින සිට වැඩ බලන ලේකම්වරයාගේ පත්වීම වසරකට දීර්ඝ කර ඇත.

- වැඩ බලන ගණකාධිකාරි - එච්.ඩබ්.එන්.කුමාර මහතා -: 2018 අප්‍රේල් 01 දින සිට වැඩ බලන ගණකාධිකාරිවරයාගේ පත්වීම වසරකට දීර්ඝ කර ඇත.

මේ අනුව 2018.03.31 දින වන විට සේවා නියුක්තිය පහත පරිදි වේ.

| තනතුර | අනුමත | පුරවන ලද | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 [a] | - |
| ගණකාධිකාරි | 01 | 01 [a] | - |
| සම්බන්ධිකරණ ලේකම් | 01 | 01 | - |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 03 | 0 | 03 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 0 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 02 | - |
| රියදුරු | 02 | 02 | - |
| කාර්යාල කාර්ය සහයක | 02 | 02 | - |
| එකතුව | 15 | 10 | 05 |

[a] අර්ධ කාලීන

**5.4 පුහුණුව**

BIMSTEC කලාපීය රටවල නිලධාරීන් වෙනුවෙන් ඉන්දියානු මැතිවරණ කොමිෂන් සභාවේ IIIDM ආයතනය විසින් 2018 මාර්තු 26 දින සිට 2018 මාර්තු 30 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර දි පැවැත්වූ ධාරිතා වර්ධන වැඩසටහන සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාව නියෝජනය කරමින් සම්බන්ධීකරණ ලේකම් නලින් සේමගේ මහතා සහභාගී විය.

**6.0 නොවිසඳුනු කාරණා**

1. භාරගත් පත්වීම් අනුව සීමා නිර්ණය කොමිෂන් සභා සාමාජිකයෝ 2015.11.19 දින ව්‍යවස්ථා සභාව විසින් ප්‍රථම රැස්වීමට කැඳවනු ලැබූහ.
2. ඉහත සඳහන් කළ පරිදි පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවට නියමිත කාර්ය භාරයක් නියම වී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ පවත්නා අනපනත් හා කාර්ය පටිපාටි කිහිපයක් මඟින් මැතිවරණ කොට්ඨාස හා පරිපාලන මට්ටම්වල විවිධාකාරයේ සීමා නිර්ණයන් සිදු වෙමින් පවතින අතර මෙම ප්‍රශස්ත ප්‍රතිලාභ ලැබීමට නම් ඒ සියල්ල යථායෝග්‍ය ලෙස සිදු කළ යුතුය.
3. එවන් තත්වයක් ඇති කිරීමේ අරමුණින්,
   - 2016 ජූලි මාසයේදී "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය භාරය පුලුල් කිරීම යන මැයෙන් යුතු ප්‍රතිපත්ති යෝජනාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.
   - එම යෝජනාවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙහෙයුම් කමිටුවේ රාජ්‍ය සේවය පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුවේ ලේකම්වරයා වෙත, සභාපතිවරයා විසින් සකස්කරන ලද " නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සකස්කරන විට සීමා නිර්ණය කොමිෂන් සභාව සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු කාරණා." යනුවෙන් වූ ඇමුණුමක්ද සහිතව 2016 ජූලි මස ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව අනු කමිටුවේ සැලකිල්ලට භාජනය විය.
   - නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේදී හෝ ව්‍යවස්ථා සංශෝධනයක් සිදු කරන විටදී සැලකිල්ලට භාජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය කිරීම සඳහා වූ මූලධර්මය ප්‍රතිපත්ති රාමුව" යන මැයෙන් සකස් කරන ලද ලිපියක් 2016 ඔක්තෝබර් මාසයේදී එහි සභාපතිවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යවන ලදි.
   - සීමා නිර්ණය කොමිෂන් සභාවට මෙම යෝජනා සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිචාර අපේක්ෂාවෙන් සිටී.